# මැතිවරණ කොමිෂන් සභාව

## தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.elections.gov.lk* *e-mail : info@elections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : PE1/25/2020<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2021.03.16<br>திகதி |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම කොමිෂන් සභා ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්,

**ඡන්ද හිමි නාම ලේඛන උපුටන නිකුත් කිරීම සීමා කිරීම.**

රජයේ විවිධ ආයතන විසින් ඡන්දහිමි නාමලේඛන උපුටන ඉල්ලා සිටීම හේතුවෙන් ඡන්දහිමි නාමලේඛන උපුටන ලබා ගැනීම සඳහා ජනතාව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත එක්රැස් වන බවට මා වෙත වාර්තා වී ඇත.

02. මේ දිනවල පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ජනතාව එක්රැස්වීම වැළැක්වීම සඳහා ම විසින් ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම සීමා කරන ලෙස දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් වෙත දැනුම් දී ඇත.

03. තොරතුරු සනාථ කරගැනීම සඳහා ජනතාවගෙන් ඡන්දහිමි නාමලේඛන උපුටන ඉල්ලා නොසිටින ලෙස ඔබ කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාල වලට අනුයුක්ත කර ඇති ඔබගේ නිලධාරීන් දැනුමවත් කරන මෙන් ඉල්ලමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1980 අංක 44 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධානයන්ට යටතේ ඡන්දහිමි නාමලේඛන සකස් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ඡන්ද විමසීමට අදාල පනත්වල කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා පමණකි. එහෙත් පුරවැසියන්ගේ පදිංචිය සනාථ කරගැනීම සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන වෙනත් කිසිදු ලේඛනයක් නොමැති නිසා රාජ්‍ය ආයතන විසින් පදිංචිය සනාථ කර ගැනීම සඳහා ඡන්දහිමි නාමලේඛන භාවිතා කරනු ලැබේ.

04. පසුගිය වර්ෂ 5ට අදාලව ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචිව ඇත්දැයි ජාතික හැඳුනුම්පත් අංක මගින් පරික්ෂාකර බැලීම සඳහා www.elections.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ මහජනයාට පහසුකම් සලසා ඇත. එමගින් ලියාපදිංචි වර්ෂය, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ස්ත්‍රී/පුරුෂ භාවය, මැතිවරණ කොට්ඨාසය/ පරිපාලන දිස්ත්‍රික්කය, ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාස අංකය හා ලියාපදිංචි අනු අංකය පරික්ෂාකර බැලිය හැක. එමෙන්ම සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයකම පසුගිය වසර පහක තොරතුරු කාර්යාල වේලාවන්හිදී පරික්ෂා කර බැලිය හැක.

05. ඔබට ඡන්දහිමි නාමලේඛන තොරතුරු අවශ්‍ය වන විට පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැක.

05.01 අපගේ වෙබ් අඩවියෙන් මුද්‍රිත පිටපතක් ලබා ගැනීම/ මහජනයාට එමගින් ලබා ගන්නා මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කරන ලෙස දැන්වීම.

05.02 ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් විස්තර පරික්ෂා කර බලා එවන ලෙස අයදුම්පතේ සඳහන් කිරීම හෝ ඒ සඳහා ආකෘතියක් හඳුන්වා දීම. ( ආදර්ශ ආකෘතියක් මේ සමග එවා ඇත.) ග්‍රාම නිලධාරී විසින් මෙම ආකෘති පත්‍රය අත්සන් කරනු නොලැබේ.

05.03 පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයක් ඩී.එස්. 04 ආකෘතිය මගින් ග්‍රාම නිලධාරී නිකුත් කරනු ලබන අවස්ථාවකදී ප්‍රචර්ථන නාමලේඛනයේ ඡන්දහිමි නාමලේඛන විස්තර (2) (ඉ) 11 කරුණ යටතේ සටහන් කිරීම හැර ඡන්දහිමි නාමලේඛනයේ වෙනත් තොරතුරු ග්‍රාම නිලධාරීන්ට සටහන් කිරීම / සනාථ කිරීමට නොපැවරිය යුතු බව දන්වමි.

05.04 ඡන්දහිමි නාමලේඛන තොරතුරු ජංගම දුරකථනයකින් හෝ කැමරාවකින් ඡායාරූපයක් ලෙස ලබා ගැනීමට අවස්ථාව ලබාදීම. මෙසේ ලබාගන්නා ඡායාරූපය මුද්‍රිත හෝ මෘදු පිටපතක් ලෙස ඉදිරිපත් කරන ලෙස දැන්වීම.

06. ඉහත් 04 සහ 05 ඡේදවල තොරතුරු පසුගිය වසර 5 ට අදාලව සනාථ කර ගැනීම අවශ්‍ය වන්නේ නම් දිවයිනේ සියළුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි සකස්කර ඇති ඡන්දහිමි නාමලේඛන තොරතුරු නියමිත ගාස්තු අයකර ඊ සේවාවක් මගින් රාජ්‍ය ආයතන වෙත පමණක් ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.

07. වර්ෂ 1991 සහ ඊට පෙර ඡන්දහිමි නාමලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත. 1992, 1993 හා 1994 වර්ෂවල නාමලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදීම සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලය වෙත ගෙන්වාගෙන ඇති අතර ඒවා මේ වන තෙක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදී නොමැත.

08. ඔබගේ රාජකාරී අවශ්‍යතා සඳහා ඡන්දහිමි නාමලේඛන තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත විස්තර 2021.03.31 දිනට පෙර මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලෙස දන්වමි. කරුණු කිහිපයක් සඳහා තොරතුරු අවශ්‍ය වන විට වෙන වෙනම ඉදිරිපත් කරන්න.

1. ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය, ෆැක්ස් අංකය, ඊ තැපැල් අංකය:
2. ඡන්දහිමි නාමලේඛන තොරතුරු අවශ්‍යතාවය:
3. මීට පෙර මෙම තොරතුරු ලබාගත් ආකාරය:
4. අවශ්‍ය වර්ෂය/ වර්ෂ:
5. තොරතුරු අපේක්ෂිත ආකාරය:
6. මෙම කාර්යය සම්බන්ධීකරණ නිලධාරියාගේ විස්තර

(නම / තනතුර, කාර්යාල ලිපිනය / ජංගම හා ස්ථාවර දුරකථන අංක/ ඊ තැපැල් අංක )

07. මේ සම්බන්ධයෙන් ඔබගේ නිලධාරීන්ගේ ප්‍රමුඛ අවධානය යොමු කරවන ලෙසද කාරුණිකව ඉල්ලමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත: සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්, - දැනගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා.

සභාපති
தவிசாளர்

දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

ලේකම්
செயலாளர்

දුරකථන/தொலைபேசி : 011-2868406
ෆැක්ස්/தொலைநகல் : 011-2868406
*e-mail : admin@elections.gov.lk*

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන්ගේ විස්තර සටහන් කර ගැනීම සඳහා සපයනු ලබන ආකෘති පත්‍රය.

මැතිවරණ කොට්ඨාසය:- ..........................................................

| ලියාපදිංචි ඡන්දහිමියාගේ සම්පූර්ණ නම | වර්ෂය ..........<br>ඡන්ද ප්‍රදේශය ..........<br>පාර/ගම/වත්ත ..........<br>ගෘහ අංකය .......... | | වර්ෂය ..........<br>ඡන්ද ප්‍රදේශය ..........<br>පාර/ගම/වත්ත ..........<br>ගෘහ අංකය .......... | | වර්ෂය ..........<br>ඡන්ද ප්‍රදේශය ..........<br>පාර/ගම/වත්ත ..........<br>ගෘහ අංකය .......... | | වර්ෂය ..........<br>ඡන්ද ප්‍රදේශය ..........<br>පාර/ගම/වත්ත ..........<br>ගෘහ අංකය .......... | | වර්ෂය ..........<br>ඡන්ද ප්‍රදේශය ..........<br>පාර/ගම/වත්ත ..........<br>ගෘහ අංකය .......... | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඡන්ද කොට්ඨාසය | පිළිවෙළ අංකය | ඡන්ද කොට්ඨාසය | පිළිවෙළ අංකය | ඡන්ද කොට්ඨාසය | පිළිවෙළ අංකය | ඡන්ද කොට්ඨාසය | පිළිවෙළ අංකය | ඡන්ද කොට්ඨාසය | පිළිවෙළ අංකය |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ඉහත තොරතුරු ඡන්දහිමි නාමලේඛන පරික්ෂා කොට මවිසින් නිවැරදිව සටහන් කරගත් බව ප්‍රකාශ කරමි.

තොරතුරු සකස් කරන ලද අයගේ නම -..........................................................................

අත්සන -..........................................................................

දිනය -..........................................................................

සටහන:- මෙම ආකෘති පත්‍රය තොරතුරු සටහන් කරනු ලබන අය විසින් අත්සන් කරනු ලබන අතර මැතිවරණ කාර්යාලයීය මාණ්ඩලික නිලධාරියෙකු හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය මාණ්ඩලික නිලධාරියෙකු හෝ ග්‍රාම නිලධාරී වරයෙකු හෝ අත්සන් කර සහතික නොකරන බව කරුණාවෙන් සලකන්න.